# යාපහුවෙහි විසිතුරු සෝපාන මාර්ගය හා ද්වාර මණ්ඩපය පිළිබඳ විමර්ශනයක්

**කැලේගම ජිනරතන හිමි**

## හැඳින්වීම

යාපහුව පුරාවිද්‍යා පරිශ්‍රය වයඹ පළාතට අයත් කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි පයිලිගම ග්‍රාමසේවා වසම තුළ පිහිටියකි. වර්තමානය වනවිට දේශීය හා විදේශීය සංචාරකයින්ගේ ආකර්ශනයට ලක්වෙමින් පවතින මෙම ස්ථානයෙහි නටබුන්ව පවත්නා ස්මාරක හා වෙනත් ඉදිකිරීම් බොහෝ ප්‍රමාණයක් දැකගත හැකි ව පවතී. වත්මනෙහි දැකිය හැකි මෙම සියලු නෂ්ටාවශේෂයන් එක ම සමයක ඉදි වී නැත්තේ වුව ද ඉන් අති බහුතරයක ප්‍රමාණයක් එක ම සමයක ඉදි වී ඇති බැව් ඒවායෙහි ඉදිකිරීම් ලක්‍ෂණයන්හි පවත්නා ස්වරූපය අනුව පෙනී යයි. මෙම ඉදිකිරීම් අතර ස්තූප, බෝධිඝර, පූජනීය ගොඩනැගිලි, රාජකීය ගොඩනැගිලි, ආරක්‍ෂක ප්‍රාකාර, ප්‍රභූ නිවාස යැයි සිතියහැකි ගොඩනැගිලි, පොකුණු, දිය අගල්, වෙනත් ඉදිකිරීම් ආදී බොහෝ දේ දැකිය හැකිය. මෙහි ඇති විවිධාකාර ඉදිකිරීම් අතර සංචාරකයින්ගේ හා පර්යේෂකයින්ගේ වැඩි අවධානය යොමුව තිබෙන්නේ මෙම ස්ථානයෙහි පවත්නා මනරම් සෝපාන මාර්ගය කෙරෙහි ය. මෙය පිළිබඳව විවිධ පිරිස් විසින් විවිධ මත ඉදිරිපත් කර තිබේ. එම විවිධ මතයන් තුළනාත්මකව විමසා බලමින් මෙම විසිතුරු සෝපාන මාර්ගය හා එහි ඉහළ පිහිටි විසිතුරු මණ්ඩපය පිළිබඳව ඓතිහාසික හා පුරාවිද්‍යාත්මකව විමසා බැලීමක් මෙම අධ්‍යයනය තුළින් සිදුකෙරේ.

## විසිතුරු සෝපාන මාර්ගය හා ද්වාර මණ්ඩපය

යාපහුව ද දිවයිනේ සෙසු පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ස්මාරක ස්ථානයන් සේ ම කාලයේ වැලි තලාවෙන් සැගව ගොස් පැවත තිබී යටත් විජිත සමයේ දී නැවත එළි පෙහෙළි වූ ස්ථානයකි. මෙම ස්ථානය නැවත සොයාගන්නා ලද සමයට ආසන්න සමයක එනම් 1928 වර්ෂයේ දී මෙම ස්ථානය ගවේෂණය කළ එවක සිටි පාඨශාලාචාර්යවරයෙකු මෙම ස්ථානයෙහි එවකට දැකගත හැකිව පැවති නටබුන් පිළිබඳ වාර්තාකොට තිබේ. ඔහු විසින් මෙම ස්ථානයෙහි පැවති නටබුන් ඒවායෙහි ස්වභාවය අනුව ප්‍රමාණයන්ගෙන් දක්වා තිබේ. දගැබ් 4, ගල්ලෙන් විහාර 3, බෝධි 1, ගෙපල් 100 ක් පමණ, ගල් රූප කීපයක්, ගල් විහාර 1, ශිලා ලේඛන 3, දළදා මාලිගා 1, විෂ්ණු රූප 1, තාප්ප 2, අගල් 2, වැව් 1, වාසල් කවුළු 1, ගල් පොකුණු 10, ගල්ලෙන් 50, ලිං 1 යි යනුවෙනි.[1]

යටත් විජිත සමයේ දී මෙම ස්ථානය නැරඹීමට පැමිණි ජී.ඊ මීචින් විසින් සිය The Lost Cities of Ceylon නමැති කෘතියේ දී පෙන්වා දී ඇත්තේ මෙහි පවතින නටබුන් අනුව මෙම ස්ථානය රාජධානියක්ව පැවති සමයේ දී පැමිණි විවිධ උපද්‍රව නිසා පූර්ණ වශයෙන් ගොඩනැගිලි ඉදි නොකර අතරමග නතරකොට ඇති බවයි.[2] එහි දී ඔහු දක්වන්නේ මෙම ස්ථානයෙහි පවත්නා නටබුන් ගොඩනැගිලි එම සමයේ දී පූර්ණ වශයෙන් ඉදිකොට නොපැවති බවය. මෙහි පවත්නා නටබුන් හා කාලයත් සමඟ ඒවා විනාශයට පැමිණ ඇති ආකාරය පිළිබඳ මනා අවබෝධයකින් තොරව ඔහුගේ එම අදහස ඉදිරිපත්කොට ඇති බැවින් එය සත්‍ය සේ පිළිගත නොහැකිය.

යාපහුව යනු පර්වතයක් පාදකකොටගෙන නිමවා ඇති, කෙටි කලක් මෙරට රාජධානියක්ව පැවති මනරම් බලකොටු නගරයකි. පර්වත පාදකකොටගෙන විවිධ ඉදිකිරීම් සිදු කිරීම මෙරට ජනප්‍රිය අංගයක් බවට පත්ව ඇත්තේ අනුරාධපුර යුගයේ දී ය. විශාල පර්වතයක් මස්තකයෙහි රජ මාළිගා ඉදිකොට ඇති බවට සාධක සීගිරිය, යාපහුව, දඹදෙණිය, බෙලිගල, කුරුණෑගල වැනි



ස්ථානයන්ගෙන් මෙන්ම පර්වත යොදාගෙන ආගමික වශයෙන් වැදගත් වෙනත් ඉදිකිරීම්, අවශේෂ මාළිගා ආදී ඉදිකිරීම් සිදුකොට ඇති බවට සාධක මෙරට විවිධ ස්ථානයන්හි පවතී. මෙලෙස පර්වත මත ගොඩනැගිලි ඉදිකිරීමේ සම්ප්‍රධාය මෙරටෙහි මෙන් ම චීනය, ජපානය වැනි රටවල ද ඉතා ජනප්‍රිය අංගයකි.[3]

මෙම ස්ථානයෙහි ඉදිකිරීම් පිළිබඳ දැණුවත්වීම සඳහා ඇති කදිම කෘතියක් වශයෙන් කුරුණෑගල විස්තරය නමැති මහනුවර සමයේ දී ලියැවෙන්නට ඇතැයි සැලකෙන පුස්කොළ පොත පෙන්වාදිය හැකිය. එහි එන බොහෝමයක් ඓතිහාසික තතු සත්‍ය සේ ගත නොහැකි වන නමුදු යාපහු නුවර පැවති ගොඩනැගිලි හඳුනාගැනීම පිණිස ඉන් යම් පිටු බලයක් ලබාදෙයි.

එනිසා මෙම ස්ථානයෙහි පවතිනා ඉදිකිරීම් පිළිබඳ විමසීමට ප්‍රථමව කුරුණෑගල විස්තරයෙහි මෙම ස්ථානය හා එහි ඉදිකිරීම් පිළිබඳ දැක්වෙන ප්‍රවෘත්තිය විමසීම යුක්තිසහගත වෙයි. එහි දැක්වෙන ප්‍රවෘත්තිය වන්නේ ''එ පර්වතෙට දෙවනු නම් තිබෙනුයෙ සුන්දරගිරි පර්වතය නම් තබා එනමින් නුවරක් කරන්ඩ පටන්ගත්තාහ එ පරක්කන්බාහු මහරජ කියනුයෙ මෙ නුවර ගල්වලින් වැඩ නිම කරවයි කියා වදල කල්හි ගනනින් එක් විසි දහක් පමන ගල් වඩුවන් හා මූලා ආචාරීන් සියයක් හා දෙසිය පහක් හන්ගිඩියන් හා තුන්දහක් හිත්තරුන් හා හාරදහක් ගල්ගානා ආචාරීන් හා මෙපමන ආචාරීන් ලබී තිබෙන එ නුවර අදිකාරං නිලමෙ විසින් කියන ලද පෙලක් ගල් කරු කපව පෙලක් ගල් නෙලව පෙලක් ගල් ගාව පෙලක් පේකඩ නෙලව පෙලක් හිත්තන් කරව කියා විදන කලාහ පෙලක් ඇත් රූප නෙලති පෙලක් අස්වරූප නෙලති පෙලක් සිංහරූප නෙලති පෙලක් ව්‍යාඝ්‍ර රූප නෙලති පෙලක් මනුෂ්‍යරූප නෙලති පෙලක් හංසරූප නෙලති පෙලක් පක්ෂිරූප නෙලති පෙලක් ඡායාරූප නෙලති පෙලක් නාගරූප නෙලති පෙලක් දිව්‍යරූප නෙලති පෙලක් ස්ත්‍රී රූප නෙලති පෙලක් ලියපත් නෙලති පෙලක් ලනුගැට පන්ති නෙලති පෙලක් ලියවැල් සමන්නති පෙලක් ගිරා

රූප නෙලති පෙලක් මොනර රූප නෙලති පෙලක් හක් පිඹින රූප නෙලති පෙලක් හොරනෑ පිඹින රූප නෙලති පෙලක් බ්‍රාහ්මණ රූප නෙලති පෙලක් කොලක්කාර රූප නෙලති පෙලක් ඉරහඳ ඡායාරූප නෙලති පෙලක් බල්ලො පුට්ටුරන් නෙලති පෙලක් හයන් ඇඳන් නෙලති පෙලක් ගල්දෙර නෙලති පෙලක් ගල් උළුවහු නෙලති පෙලක් ගල්පඩි බාති මෙ ගල් වැඩ හිත්තරූ සිතියං කරති මෙසෙ නව මාලයකින් යුක්තවූ මාලිගා සතරක් ද උඩුමාල නවයක් ද බිම්මාල නවයක් ද ඒ වට කුළුගෙවල් පන්සියයක්ද අසූරියන් මහ ගබඩාවක් ද පන්සියයක් පිට වහල ගෙවල් ද මෙ ගෙවල්වලට පියලි දෙර දහසෙක් ද එවිට සත්රියන් ගල් පහුරක් ද ලොකඩ කොට්ටයක් ද රන් තොරණ දහසක් ද රිදී තොරණ දහසක් ද ධජපතාක දහසක් ද ඇතුන් දහසක් ද අසුන් දහසක් ද සූවිසි දහසක් පඩිකාර සෙනාවද දෙලක්ෂ අටසැට දහසක් සේනාව පිරිවරා ශක්‍ර දෙවෙන්ද්‍රයා සෙ සැප විඳ රජ කරණ කල්හි මෙ කියාපු වැඩ උදය එක පාටකට පෙනෙන්නේය සවස එක පාටකට පෙනෙන්නේය මෙසේ එ නුවර අලංක්‍රතව තිබෙන්නේය එ නුවර ගල්වැඩ විනා සෙසු වැඩක් නැත්තේය...'' යන්නයි.[4]

මෙම ප්‍රවෘත්තිය අතිශෝක්තියෙන් දැක්වී ඇති බැව් පැහැදිලි වන්නේ වුව ද මෙහි දැක්වෙන කැටයම් ආදී ඇතැම් දෑ එම ස්ථානයෙහි දැකගත හැකිව පවතී. එසේ ම මෙහි දැක්වෙන ඇතැම් සත්ත්ව නම් තුළින් එවක එහි පැවති පරිසරයෙහි එම සතුන් වාසය කරන්නට ඇතැයි සිතිය හැකිය. ඉන් ඇතැම් සතුන් වත්මනේ දී මෙම ස්ථානය හා ඒ අවට පරිසරයෙහි දැකගත හැකිය. මෙහි දක්වා ඇති ආකාරයට ලක්ෂ ගණනක පිරිසක් මෙහි වාසය කිරීම පිළිගත නොහැකි වුව ද මෙම ස්ථානයෙහි විශාලත්වය අනුව සැලකියයුතු ප්‍රමාණයක මිනිසුන් වාසය කොට ඇති බව ද සිතිය හැකිය. එසේම මෙහි දැක්වෙන ආකාරයට ම මෙම ස්ථානයෙහි ශිලා මාධ්‍යය උපයෝගී කොටගෙන නිමවන ලද ඉදිකිරීම් බොහෝ ප්‍රමාණයක් ද දැකගත හැකි වෙයි. එනිසා මෙම ප්‍රවෘත්තිය සම්පූර්ණ වශයෙන් බැහැර කළ හැකි නොවේ.



යාපහුව පුරාවිද්‍යා ස්මාරක භූමියෙහි පවතින අලංකාර ද්වාර මණ්ඩපය හා සෝපාන මාර්ගය ඉදිකොට ඇත්තේ වර්තමානයෙහි පැරණි දළදා මැදුර යනුවෙන් වෙන්කොට හඳුනාගනු ලබන ගොඩනැගිල්ලට ප්‍රවේශවීම පිණිසය. පර්වතයේ දකුණු දිගින් පවතින දැඩි බෑවුම තුළින් පහසුවෙන් දළදා මැදුරට ප්‍රවේෂවීම සඳහා ඉදිකොට පවත්නා මෙය මාලක කිහිපයකින් යුතුව පහළ භූමියේ සිට පනා බැමි හතරක් යෙදීමෙන් නිමවා තිබේ. මෙම මාලක එකිනෙකට සම්බන්ධකොට ඇත්තේ භූමියෙහි පහළ කෙළවරේ සිට දළදා මැදුර තනවා තිබෙන ඉහළ මලුව දක්වා ක්‍රමයෙන් ඉහළට එසවෙන පරිදි විසිතුරු අයුරින් සෝපාන මාර්ගය තැනවීමෙනි. මෙහි පනා බැමි යොදා මාලක හතරක් ඉදිකොට පැවතියේ වුව ද සෝපානය ඉදිකොට ඇත්තේ කොටස් තුනකින් යුතුවන පරිදිය. මෙලෙස මාලක හතරක් තැනවීම නිසාවෙන් පර්වතය මස්තකයට ප්‍රවිෂ්ටවීමට ඇති එකම දිශාව වන මෙහි ආරක්ෂාව සලසා ගැනීමක් ද සිදුව තිබෙන බැව් පෙනීයයි.

යාපහුව ස්මාරක ස්ථානය කාලයේ වැලිතලාවෙන් වැසී යාමත් සමඟ මෙම අලංකාර සෝපාන මාර්ගය ද අභාවයට ගොස් නටබුන් තත්ත්වයට පත්ව තිබේ. එසේ දීර්ඝ කාලයක් නටබුන් තත්ත්වයේ පැවති මෙම සෝපානය නැවත නගා සිටුවීමට පළමු මෙහෙය සිදුකොට ඇත්තේ 1886 දී එවකට පැවති ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ සහකාර ඉංජිනේරුවරයෙකු වශයෙන් කටයුතු කළ ඒ.ඊ විලියම්ස් මහතා විසිණි. මාලක තුනක් වශයෙන් ඉදිකොට පැවති මෙම සෝපානයෙහි ඉහළ මාලය ප්‍රතිසංස්කරණය කිරීමට මෙතුමා විසින් පළමුව කටයුතු යොදා ඇත. එහි දී ඔහු විසින් අතීතයේ දී සිත්කළු කැටයම් වලින් සැරසිලි සහිතව ඉදිකොට පැවති මෙහි කැඩී බිඳී ඒ මේ අත විසිරී පැවති ගල් නැවත එක්කෝළු පිළිසකර කරවා තිබේ. බිම වැටී පැවති සිංහ රූප ඒවා පැවතියයුතු නිසි ස්ථානයන්හි ස්ථානගතකොට ඇත.[5] ඉන් පසු අද්‍යයතනයේ පවතින ආකාරයට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ මැදිහත්වීමෙන් විවිධ අවස්ථාවන්හි දී මෙය ප්‍රතිසංස්කරණය කොට ඇත.

දික් අතටත් හරස් අතටත් කළ පැන්නුම් සහ එකිනෙකට වෙනස්වන අයුරින් විවිධ උස මට්ටම්වලින් යුතු සංකීර්ණ ගෘහාංගයන්ගෙන් සමන්විතවන පරිදි මනා සැලසුමක් ඇතිව තනවා ඇති මෙම සෝපාන මාර්ගය නරඹන තැනැත්තන්ගේ සිත් තුළ විචිත්‍රවත් හා සෞන්දර්යාත්මක හැඟීම් ඇති කරවනසුළු අයුරින් කැටයම් හා මූර්ති වලින් සමලංකෘතකොට තිබේ. මෙහි ඇති සියලු දෑ කලුගල් මාධ්‍යයෙන් නිමවා තිබේ. පසුව සිදුකරන ලද සංරක්ෂණ කටයුතුවල දී හිඩැස් ස්ථාන පිරවීමට කලුගල් වෙනුවට සිමෙන්ති ආදේශකොට තිබෙන බවක් ද වත්මනේ දී දැකිය හැකිය. මෙහි අව්වෙන් වැස්සෙන් ආරක්ෂා වී ඇති ඇතැම් ස්ථානයන්හි රතු පැහැති වර්ණයන් ශේෂ වී තිබීමෙන් පැහැදිලි වන්නේ පූර්වයේ දී මෙහි ඇතැම් අංගයන් හෝ ඉදි කිරීමට අදාල සියලු කලාත්මක දෑ සම්පූර්ණයෙන් රතු පැහැති වර්ණ ගන්වා පැවති බවය.[6]

මෙම සෝපාන මාර්ගයෙහි ආරම්භක ස්ථානයෙහි ඇති පියගැට පිහිටි භූමියේ සිට එය ඉදිකොට ඇති පළමුවන මාලකයෙහි උස වන මීටර් 5.40 ක් උසට විහිදී පවතී. මෙම පහත මළුව එකක් මත එකක් පිහිටන පරිදි උස මට්ටම් වෙනස්වන ආකාරයට තනවන ලද පනාබැමි දෙකක් මත ඉදිකොට තිබේ. මෙම මාලකය ස්වරූපයෙන් සිව් රැස් වන වන ආකාරයට ඉදිකොට තිබේ. මෙම පළමු පියගැට පෙළෙහි පඩි 24 ක ප්‍රමාණයක් දැකිය හැකි අතර එහි පළල මීටර් 2.55 ක් වෙයි.[7]

මෙහි දෙවන පියගැටපෙළ පිහිටි මාලකය ඉදිකොට ඇත්තේ අනෙක් මාලක දෙකට වඩා වැඩි බෑවුමක් සහිත ස්ථානයකය. එනිසාම මෙහි අංශක අනූවක කෝණයක ආකාරයට බෑවුමක් දැකිය හැකිය. මෙය පහසුවෙන් තරණය කිරීම තරමක් අපහසු කටයුත්තක් වන්නේ මෙහි ඇති උච්ච නැග්ම නිසාය. දැඩි වශයෙන් හානි සිදු වී පැවති මෙම කොටස වර්තමානයේ දී පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිසංස්කරණයකොට තිබේ. මෙහි සම්පූර්ණයෙන් පඩි 65 ක් ඇති අතර ඉන් 34 ක් ම පූර්වයෙහි මෙහි පැවති ශිලාමය පඩි සොයාගැනීමට නොහැකි වී ඇති බැවින් සිමෙන්ති භාවිතයෙන් ආදේශක පඩි වශයෙන්



නිර්මාණයකොට ඇති පඩි වෙයි. මෙම කොටසෙහි පළල මීටර් 3.60 ක් පමණවන අතර මෙහි ඉහළ කෙළවරෙහි අතීතයේ දී පියස්සක් හෝ වෙනත් එවැනි දෙයක් ඉදිකොට පැවති බව තහවුරුකරගතහැකි සාධක පවතී.[8]

මෙම දෙවන පියගැට පෙළ අවසන් වන ස්ථානයෙන් මදක් ඉදිරියේ ඇති පියගැට වලින් පහළට බැසීමෙන් පසු දළදා මැදුරට ප්‍රවේශවන තෙවන පියගැට පෙළ සහිත අලංකාර ද්වාර මණ්ඩපය හමුවෙයි. යාපහුව පිළිබඳ නරඹන්නන් පුදුමයට පත්කරවන සුළු හා සියලු දෙනාගේ අවධානයට වැඩි වශයෙන් ලක්වන නිර්මාණ සියල්ලක්ම දැකියහැකි වන්නේ මෙම පියගැට පෙළෙහි හා එයට අනුබද්ධව තනවා ඇති ද්වාර මණ්ඩපයෙහිය.

දළදා මාළිගය පිහිටා ඇති ස්ථානයට ආසන්නව පවතින මෙම සෝපානයෙහි ඉහළම කොටස හා එයට අනුබද්ධව තනවා ඇති ද්වාර මණ්ඩපය වඩාත් විස්තීර්ණ වශයෙන් සැරසිලි හා මෝස්තර යොදා අලංකෘත කොට තිබේ. මෙහි ඇති ද්වාර මණ්ඩපය නිමැවීමේ දී ඉතා දියුණු ආකාරයේ ගෘහ නිර්මාණාත්මක අංගයන් උපයෝගිකොටගෙන තිබේ. මෙම සියලු කටයුතු සඳහා ද ඉදිකිරීම් මාධ්‍ය වශයෙන් භාවිතකොට ඇත්තේ කලුගල් ය.[9]

මෙම සෝපානයෙහි සැලැස්මෙන් දැකියහැකි වන්නේ ද්වාර මණ්ඩපයේ වාහල්කඩෙහි මුහුණතින් නෙරන ලද බොක්කයකින් යුත් ඇතුළු මඟකින් සමන්විත බරාදයක පිට මායිමය. දෙමහල් ප්‍රාසාදයන්හි හැඩයෙන් යුතු ටැම් මෙහි දැකිය හැකිය. සෝපානය දෙපස පිහිටා ඇති මිටි තාප්පවල මුදුන් දිගේ පාමුල කණුවල සිට ඉහළ අතට යක්ෂ ශීර්ෂ, පෙරදිග සිංහ හා පුරාකථාවල එන මෘග යනාදීන්ගේ පැතලි රූප ජෝඩු කැටයම්කොට ඇති බව දැකිය හැකිය. එසේම අනාබද්ධ රූපයන් ද මෙහි දැකිය හැකිය. මෙම සෝපානය කාම්බෝජයේ ඛමේර් පිරමිඩ්හි පඩිපේළිවලට සමානබවක් දක්වන බැව් වික්ටර් ගොලුබ්ව් විසින් රාජකීය ආසියාතතික සංගමයේ ලංකා ශාඛාවේ සඟරාවට ලිපියක් සපයමින් දක්වා ඇත. එහි දී ඔහු දක්වා

ඇත්තේ මෙම සමානත්වය ශ්‍රී ලංකාව හා ඉන්දු චීනය අතර ශිල්පීය සබඳතා නිසා ඇති වූවක් සේ සිතියහැකි නොවන බවයි. එසේ වුවද මෙම සමයේ ඉතිහාසය විමැසීමේ දී එවැනි සබඳතා ඇතිවිය හැකිව පැවති බව පෙනීයයි. යාපහුව ආක්‍රමණය කළ චන්ද්‍රභානු හෝ ඔහුගේ පුත්‍රයා මෙහි පැමිණ ඇත්තේ ඛමේර් කලාවේ බලපෑම පැවති රටකිනි. එනිසා මෙම දෙදෙනාගේ බලපෑමෙන් එම ශෛලිය මෙරටට ලැබෙන්නට ඇති බව අනුමාන කළ හැකිය. එසේම පළමුවන භුවනෙකබා රජුගේ සමයේ දී වැඩසිටි ධම්මකිත්ති තෙරුන්වහන්සේ වැඩමකොට ඇත්තේ ද මලයා අර්ධද්වීපයේ ලිගෝර් ප්‍රදේශයෙනි. කාම්බෝජ කලාවේ බලපෑම උන්වහන්සේ නිසාවෙන් මෙරටට ලැබෙන්නට ඇතැයි ද සිතිය හැකිය. කෙසේ වුවද මෙම සමයේ දී එම ශෛලිය මෙරටට පැමිණීමට තරම් විවිධ සබඳතා එම ප්‍රදේශය හා මෙරට පැවති බව පෙනී යයි.[10]

මෙහි දැකිය හැකි ද්වාර මණ්ඩපයෙහි පාදම් නිමවා ඇති ආකාරයත්, ටැම් සිටුවා ඇති ආකාරයත් අනෙක් වාස්තුවිද්‍යාත්මක ලක්ෂණත් පිළිබඳ විමැසීමේ දී එය තුළින් යාපහු සමයේ දී පැවති සිංහල වාස්තුවිද්‍යාත්මක ක්‍රමයන්හි ලක්ෂණ ඉක්මවා යන ස්වාභාවයක් ගම්‍යවෙයි. මෙහි දැකියහැකි ලක්ෂණයන්ට අනුව මෙය දකුණු ඉන්දියාවෙහි සමකාලීනව පැවති ද්‍රවිඩ සම්ප්‍රදායට අනුව නිමවා ඇති බැව් පෙනීයයි. මෙය පාණ්ඩ්‍ය බලපෑම නිසා සිදුවූවක් විය හැකිය.[11,12] මෙම සෝපානයෙහි පවතින බොරදම්, කුළුණු ඇතුළු ඇතැම් ගෘහනිර්මාණමය ලක්ෂණයන් හා කලාත්මක අවශේෂයන් යාපහු අවධියට ආසන්නව එයට පූර්වයෙහි හා පසුව පැවති දඹදෙණිය විජයසුන්දරාරාමය, නියම්ගම්පාය හා ගඩලාදෙණි යන විහාරයන්හිත්, සීතාවක බැරැන්ඩි කෝවිල තුළත් ප්‍රකට වන දක්ෂිණ භාරතීය ශෛලිගත කලා නිර්මාණයන් සමග සමීප බවක් දක්වන බැව් පෙනී යයි.[13, 14]

මෙහි දැකියහැකි ගල් කැටයම් විමර්ශනය කිරීමේ දී පෙනීයන්නේ එම කැටයම් තුළින් ඒවා නිපදවන ලද කලාකරුවන් විසින් කිසියම් දෙයක් නිරූපණය කිරීමේ දී තම



පරිකල්පනයෙන් එහි අභ්‍යන්තරික ස්වරූපය ගම්‍ය කිරීමට වඩා සම්මත ආකෘති මත පිහිටා කටයුතු කිරීමට පෙළඹී ඇති බවය. එහි දී විශේෂයෙන් මානව රූපයන් දැක්වීමේ දී ඒවායෙහි අඟ පසඟ චලනය කිරීම් වැනි ඉරි අව් දැක්වීමට අවශ්‍ය ප්‍රමාණයටත් වඩා අත් පා නැවීම් සෙලවීම් වැනි චලනයන් නිරූපණයකොට ඇත්තේ වුව ද ඒවා තුළින් ක්‍රියාකාරී බවක් අර්ථවත්වෙනවා වෙනුවට දැකිය හැකිවන්නේ අප්‍රාණික දරදඬු ස්වාභාවයකි.[15]

මෙහි දොරටුවට පහළින් දැකියහැකි නාට්‍ය හා වාද්‍ය විලාසය විදහාලන කැටයම්වලට සමාන කැටයම් නියම්ගම්පාය, ගඩලාදෙණිය, අම්බුළුගල හා ගලපාත යන විහාරස්ථානයන්හි ගල් ටැම්, උළුවහු හා ගොඩනැගිලිවල අධිෂ්ඨාන ආදී විවිධ අංගයන් සැරසිලි කිරීමට භාවිතකොට ඇති බැව් එම ස්ථානයන්හි දැකිය හැකි කැටයම් විමැසීමෙන් පෙනී යයි. එම ස්ථාන ගම්පොළ සමයේ කැටයම් කලාව නිරූපිත ස්ථානයෝ වෙති.[16] යාපහුවේ දැකිය හැකි මෙම කැටයම් තුළින් දළදා පෙරහැරක් නිරූපණය කෙරන බවට පිළිගැනීමක් ද වෙයි.[17]

යාපහුවෙහි දැකියහැකි නිර්මාණයන් අතර බොහෝ දෙනෙකුගේ ඩැඩි අවදානයට ලක්ව ඇති නිර්මාණයක් වශයෙන් මෙම සෝපානයෙහි ස්ථාපිතකොට ඇති සිංහ රූප දෙක හැඳිනගත හැකිය. මෙම සිංහ රූපදෙක නිමවා ඇත්තේ ස්වාභාවික ශරීර ලක්ෂණයන් ඉක්මවා යන ආකාරයෙනි. ශ්‍රී ලංකාවේ දැකියහැකි බොහෝමයක් සිංහ රූප ශක්තිය, වීර්යය, එඩිතරබව හා අලංකාරය නිරූපණය කෙරෙන සේ නිමවා තිබේ. ඒවායින් බොහෝවිට නිරූපණය කෙරෙන්නේ ඉදිරි ගාත් මඳක් ඔසවා ශක්තිය ගෙන පහරදීමට සැරසී සිටින ඉරි අව්වකි.[18] යාපහුවේ සිංහ රූප තුළින් ගම්‍ය වන්නේ ද මෙම ස්වරූපයයි. එමෙන් ම යාපහුවෙහි පවත්නා මෙම සිංහ රූප දෙක භාරතීය විජයනගර කලා ශිල්පයේ ආභාෂයෙන් නිර්මාණය වූවක් බවට ද මතයක් පවතී.[19] මෙහි පවත්නා ද්වාර මණ්ඩපයට අදාලව නිර්මාණයකර පැවති ශෛලමය ජනෙල් කවුළු දෙක ද බොහෝ දෙනෙකුගේ වැඩි අවදානයට ලක්ව ඇති කඩාවැටී බිම පතිතව පැවති මෙම ජනෙල් කවුළු දෙකෙන් එකක් දැනට කොළඹ

ජාතික කෞතුකාගාරයෙහි ප්‍රදර්ශනයට තබා ඇති අතර අනෙක යාපහුවෙහි ඇති පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ පාලනය වන කෞතුකාගාරයෙහි තැන්පත්කොට ඇත.

මෙම ජනෙල් කවුළු ද්විත්වය නිමවා ඇත්තේ අගල් 7 ක් පමණ ඝණකමකින් යුත් ගල් ලැලි මතය. මෙම කවුළු මත ඉතා සියුම් ආකාරයට විසිතුරු අයුරින් කැටයම් රැසක් ද නිමවා තිබේ. මේවායෙහි දැකිය හැකි කැටයම් තුළින් එම සමයේ දී සිටි කලාකරුවන් සතුව පැවති කලා හැකියාවන් ඉතා උසස් මට්ටමක පැවති බැව් පෙනී යයි. මෙම ජනෙල් කවුළු සාදා තිබෙන්නේ වෘත්තාකාර කවුළු 45 ක ප්‍රමාණයක් යෙදීමෙනි. එම වෘත්ත මත වාමන, ගජසිංහ, සිංහ, හංස, නළගන ආදී විවිධ රූපයන් කැටයම්කොට තිබේ. එසේම රථ චක්‍ර කිහිපයක් ද එම කවුළු මධ්‍යයේ දැකියහැකිය. මෙම අලංකාර ජනෙල් කවුළු දෙක ද්වාර මණ්ඩපයේ ගෘහයට යෙදීමෙන් බලාපොරොත්තු වන්නට ඇත්තේ ගෘහය තුළට වාතය ලබාගැනීම හා බාහිර අලංකරණය වියහැකිය.[20]

තව ද මෙම දර්ශනීය ද්වාර මණ්ඩපය සහිත පියගැට පෙළෙහි වාමන රූප, ගජසිංහ රූප, ඇත් රූප, සිංහ රූප, අශ්ව රූප, හංස රූප, කොරවක්ගල්, මකර තොරණ, පියුම් සහිත බොරදම්, ද්‍රවිඩ වාස්තු විද්‍යාවේ අංගයක් වන කුඩු මෝස්තර, කාන්තා රූප, පුරුෂ රූප, ලක්ෂමී රූප, පුන් කලස්, වස්ත්‍රාභරණ, කිහිඹි මුහුණ, ලියවැල්, වාද්‍ය භාණ්ඩ, පේකඩ, ලීස්තර, ආදී විවිධ කැටයම් දැකිය හැකිය. මෙම කැටයම් එවක සිටි විදේශීය ආභාෂයක් සහිත දේශීය ශිල්පීන් විසින් හෝ විදේශීය ශිල්පීන්ගේ අනුදැණුම මත ඔවුන්ගේ සහභාගිත්වය ද ඇතිව දේශීය ශිල්පීන් විසින් සිදුකරන්නට ඇතැයි සිතිය හැකිය.

## සාරාංශය

යාපහුව පුරාවිද්‍යා ස්මාරක ස්ථානය තුළ මෙරට ප්‍රාග් ඉතිහාසයෙහි හා ඓතිහාසික අවධියේ මුල් සමයෙහි තතු හෙළිකෙරන ඉතා දීර්ඝ සමයක පටන් පැවතෙන පුරාවිද්‍යාත්මක



හා සාහිත්‍ය මූලාශ්‍රයන් පවතී. එසේ වුවද මෙම ස්ථානයෙහි වත්මන් සමෘද්ධියට අදළ ඉදිකිරීම් සිදුව ඇත්තේ දහතුන්වන සියවසේ දී ය. ඒ බැව් පුරාවිද්‍යාත්මක වශයෙන් මෙන්ම සාහිත්‍යාත්මක වශයෙන් ද තහවුරු වී තිබේ. දහතුන්වන සියවසේ දී පාලන මධ්‍යස්ථානයක් වශයෙන් පැවති මෙම ස්ථානය ඉන් අනතුරුව දහනමවන සියවස දක්වාම වැඩි දෙනෙකුගේ අවධානයෙන් ව්‍යුක්ත වූ ස්ථානයක් වශයෙන් පැවතිණි. නැවත මෙම ස්ථානය එළිපෙහෙළිකොට පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත්කම් සහිත ස්ථානයක් බවට පත්වන්නේ ඉංග්‍රීසීන්ගේ මැදිහත්වීමෙන් දහනමවන සියවසෙහි දී පටන් ය. එවක පටන් මෙම ස්ථානයෙහි විවිධ වශයෙන් අධ්‍යයනයන් සිදුවෙමින් පවතී. මෙම ස්ථානයෙහි ඇති ඉදිකිරීම් පිළිබඳව අධ්‍යයනය කරනුලබන බොහෝ දෙනෙකුගේ වැඩි අවධානයක් යොමුව ඇත්තේ දළදා මාළිගාව යනුවෙන් වර්තමානයේ නම්කොට තිබෙන ගොඩනැගිල්ලට ප්‍රවේෂවීම සඳහා ඉදිකොට තිබෙන අලංකාර සෝපාන මාර්ගය හා එහි ද්වාර මණ්ඩපය කෙරෙහිය. ඒ සඳහා හේතුව් ඇත්තේ එහි ඉදිකිරීම් සඳහා භාවිතකොට ඇති අලංකාරමය ස්වාභාවයයි. මෙම අලංකාර සෝපාන මාර්ගය හා එහි ද්වාරමණ්ඩපයෙහි ඇති ලක්‍ෂණ විචක්‍ෂණව විමැසීමේ දී පෙනීයන කාරණය වන්නේ එය තත් කාලීනව මෙරටට යම් යම් සබඳතා පැවති ඇතැම් විදේශීය කලා ශෛලීන් හා දේශීය කලා ශෛලියෙහි එකතුවෙන් විදේශීය හා දේශීය කලා ශිල්පීන් විසින් නිමවා ඇති බවයි. ඒ බව ඉහත දක්වන ලද මූලාශ්‍රයන් තුළින් මැනැවින් විෂධවෙයි.

## ආන්තික සටහන්


1. රණසිංහ, ඩී.ඩී (1927), පුරාවෘත්ත, කොළඹ: ගොඩගේ, පි. 12.
2. මීට්න්, ජී.ඊ, (2007), ලංකාවේ නටබුන් නගර, පරි- ජයකොඩි, සරත්චන්ද්‍ර, කොළඹ: සදීපා ප්‍රකාශන මන්දිරය. පි. 244.
3. අමරසිංහ, මාලිංග, (2011), පුරාවිද්‍යා ලිපි I, කොළඹ: දයාවංශ ජයකොඩි සහ සමාගම. පි: 58.
4. කුරුණෑගල විස්තරය, (1971), සංස්- නන්දසේන, මුදියන්සේ, ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය, කොළඹ: ගුණසේන. ජේද: 27-27.

5. මීට්න්, ජී.ඊ, (2007), ලංකාවේ නටබුන් නගර, පරි- ජයකොඩි, සරත්චන්ද්‍ර, කොළඹ: සදීපා ප්‍රකාශන මන්දිරය. පි. 240-241.

6. දිසානායක, සෙනරත්, (2004), අසිරිමත් යාපහුව, කර්තෘ ප්‍රකාශන, මහරගම: තරංජී ප්‍රින්ට්ස්. පි. 41.

7. යාපහුව ගවේෂණ වාර්තාව, (2001), පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ, පි. 46.

8. එම, පි. 46,53.

9. දිසානායක, සෙනරත්, (2004), අසිරිමත් යාපහුව, කර්තෘ ප්‍රකාශන, මහරගම: තරංජී ප්‍රින්ට්ස්. පි. 41.

10. පරණවිතාන, ඇස්, (1971), දඹදෙණි රජ පෙළපත, ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය, I කාණ්ඩය, ii භාගය, සංස් - චන්ද්‍ර රාය, හේම්, දෙ:මු, කැලණිය: විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය. පි. 735.

11. එම, පි. 35.

12. මුදියන්සේ, නන්දසේන, (1998), දඹදෙණි යුගයේ සිට කෝට්ටේ යුගය තෙක් වාස්තුවිද්‍යාව, අපේ සංස්කෘතික උරුමය - ද්විතීය භාගය, කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල. පි. 361.

13. සේනානායක, පියතිස්ස, (2013), ශ්‍රී ලංකාවේ පුරාණ දළදා මාළිගා, සිරි දළදා හරසරණිය ශාස්ත්‍රීය සංග්‍රහය, සංස්- ධීරානන්ද හිමි, හඟුරන්කෙත, මීගස්කුඹුර, පී.ඩී සහ හේරත්, එච්,එම්,ආර්,ඩී, කොළඹ: රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව. පි. 208.

14. යාපහුව ගවේෂණ වාර්තාව, (2001), පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, කොළඹ, පි:54.

15. ලක්දුසිංහ, සිරිනිමල්, (1998), කැටයම් කලාව, අපේ සංස්කෘතික උරුමය - ද්විතීය භාගය, කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල. පි. 393.

16. එම, පි. 393.

17. ඒකනායක, ඇකිරියගල, (2008), අපේ ශිෂ්ටාචාරය 3, කොළඹ: ගොඩගේ, පි. 130.

18. මීට්න්, ජී.ඊ, (2007), ලංකාවේ නටබුන් නගර, පරි- ජයකොඩි, සරත්චන්ද්‍ර, කොළඹ: සදීපා ප්‍රකාශන මන්දිරය. පි.240-242.

19. සේනානායක, පියතිස්ස, (2013), ශ්‍රී ලංකාවේ පුරාණ දළදා මාළිගා, සිරි දළදා හරසරණිය ශාස්ත්‍රීය සංග්‍රහය, සංස්- ධීරානන්ද හිමි, හඟුරන්කෙත, මීගස්කුඹුර, පී.ඩී සහ හේරත්, එච්,එම්,ආර්,ඩී, කොළඹ: රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව. පි.208.

20. ඒකනායක, ඇකිරියගල, (2008), අපේ ශිෂ්ටාචාරය 3, කොළඹ: ගොඩගේ, පි. 128-129